පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 10 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- නර්තනය - I , II

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ...............................

කාලය : පැය තුනයි

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. පංචතූර්ය වාදනය සඳහා ඝන වාද්‍ය භාණ්ඩයක් ලෙස .......................................... භාවිතා කළ හැකිය.
   i. කොම්බුව
   ii. තලිය
   iii. හොරණෑව
   iv. බුම්මැඩිය

2. කාසි රටේ සිට පැමිණි බැව් කියන ...................................... සොකරිගේ ස්වාමිපුරුෂයා වේ.
   i. සොත්තානා
   ii. වෙදරාළ
   iii. අඬබෙරකරු
   iv. ගුරුහාමි

3. නර්තන ඉතිහාසය හා සබැඳි කරුණු ඇතුළත් කොරවක්ගල සෙල්ලිපිය .................................... යුගයට අයත් වේ
   i. පොළොන්නරු
   ii. අනුරාධපුර
   iii. ගම්පොළ
   iv. කෝට්ටේ

4. දවුල සුදු පිරුවටයකින් ආවරණය කරනු ලබන්නේ ..................................... වාදනයේදී ය.
   i. අණබෙර
   ii. මඟුල්බෙර
   iii. මළබෙර
   iv. අත්‍යාබෙර

5. ලය ප්‍රභේද අනුව නර්තනයේදී ඉතා අඩු වේගය ........................................... ලෙස හැඳින්වේ.
   i. විලම්භ
   ii. අතිද්‍රැත
   iii. මධ්‍ය
   iv. ද්‍රැත

6. සතර අභිනයන් අතුරෙන් රංග වස්ත්‍රාභරණ ........................................ අභිනයට අයත් වේ.
   i. ආංගික
   ii. සාත්වික
   iii. වාචික
   iv. ආහාර්ය

7. කථකලී නර්තනයේ දී ......................................... නමින් හඳුන්වනු ලබන්නේ රැවුල් සඳහා භාවිතා කරනු ලබන අංග රචනයයි.
   i. තාඩි
   ii. මිනිත්තු
   iii. ඩෙප්පු
   iv. කත්ති

8. සොබමන් දෙවිවරු .........................එතැනට යන කවි පදය චාමර ගායනයට අයත් වේ.

i. දෙදෙනෙක් iii. තිදෙනෙක්
ii. සදෙනෙක් iv. සොලොසක්

9. දුටුගැමුණු රජු නළඟනන් පිරිවරා ...................................... ධාතු නිධන් කිරීමේ උත්සවයට ගිය බව මහාවංශයේ සඳහන් වේ.

i. රුවන්වැලිසෑයේ iii. අභයගිරියේ
ii. ථූපාරාමයේ iv. මිරිසවැටියේ

10. අතීතයේ දී යුද්ධ කටයුතු සන්නිවේදනය සඳහා වාදනය කර ඇත්තේ,

i. අඬබෙරය iii. බුම්මැඩිය
ii. රණබෙරය iv. තම්මැට්ටමය

11. පිළිවෙලින් ඉලංගම් සරඹ සහ ගොඩ සරඹ අවසානයේ නටනුයේ,

i. කස්තිරම හා සීරුමාරුව
ii. ඉරට්ටිය හා අඩව්ව
iii. කස්තිරම සහ ඉරට්ටිය
iv. ඉරට්ටිය හා කස්තිරමය

12. පුරුෂ පක්ෂයට වඩාත් විශේෂිත වූ ජන නර්තනයකි.

i. කඩු iii. චාමර
ii. කළගෙඩි iv. කුලු

13. ආචාර්ය පනීභාරතයන් විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍ය දෙකක් වන්නේ,

i. සැලළිහිණිය, පරෙවිය iii. ග්‍රහ අපලය, සත්පත්තිනි
ii. කුණ්ඩකේෂි, ග්‍රහ අපලය iv. චණ්ඩලිකා, සත්පත්තිනි

14. ගොයම් කැපීමමේ නර්තනයට සමාන දෙමළ නර්තනය වනුයේ,

i. අරව්වෙට්ටු ය iii. වෙම්බු ය
ii. කුම්මි ය iv. සුලකු ය

15. ලක්නව්, ජායිපූර් ගුරුකුල වලට අයත් භාරතීය නර්තන සම්ප්‍රදාය වන්නේ,

i. කථක් ය iii. කථකලී ය
ii. මනිපුරී ය iv. භරත ය

16. රජු ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බව ඓතිහාසික තොරතුරු හමුවන්නේ,

i. අනුරාධපුර යුගයේ ය iii. පොළොන්නරු යුගයේ ය
ii. කෝට්ටේ යුගයේ ය iv. දඹදෙණි යුගයේ ය

17. බන්දුල ජයවර්ධන සූරින් විසින් නිර්මාණය කරන ලද 'හනික වරෙව් කොල්ලනේ ' ගීතය ඇතුළත් නාට්‍ය වන්නේ,

i. රාජකපුරු ය
ii. සක්විති රාවණා ය
iii. නරිබෑණා ය
iv. බෙරහඬ ය

18.



A



B



C

ඉහත A,B,C රූප මඟින් දැක්වෙන හිසෙහි පළඳින රංග වස්ත්‍රාභරණ හඳුන්වන්නේ පිළිවෙලින්,

i. ශිඛාබන්ධනය, කිරිටම්, උච්චපට්ටම්
ii. ශිර්ෂාභරණ, ජමික්කි, කිරිටම්
iii. ශිඛාබන්ධනය, උච්චපට්ටම්, කිරිටම්
iv. උච්චපට්ටම්, කිරිටම්, ශිඛාබන්ධනය

19. 'කච්චකෙට්ට' අභ්‍යාස හා තට් අඩව් පුහුණුව ලබාදෙන නර්තනය ඇතුළත් රූපය වන්නේ

i. A හා B රූප වලිනි
ii. A හා C රූප වලිනි
iii. B හා C රූප වලිනි
iv. C හා B රූප වලිනි

20. කරදිය මුද්‍රා නාට්‍යයේ රංගභූමි අලංකරණය සහ වෙස් මෝස්තර නිර්මාණය කරන ලද්දේ,

i. නිමල් වෙල්ගම මහතා ය
ii. සීබට් ඩයස් මහතා ය
iii. සෝමබන්ධු විද්‍යාපති මහතා ය
iv. චිත්‍රසේන ඩයස් මහතා ය

21. උඩරට, පහතරට, සබරගමු ශාන්තිකර්ම වලට අයත් නර්තන අංග පිළිවෙලින්,

i. හත්පද, කප්සිටුවීම, මඩුපේ කිරීම
ii. දළුමුර පිදීම, කප් සිටුවීම, මඩුපේ කිරීම
iii. මඩුපේකිරීම, නානු මුරය කිරීම, කොලොන්නපද නැටීම
iv. හත්පද නැටීම, දලුමුර පිදීම, යහන් දැක්ම

22. සබරගමු නර්තන සහ උඩරට නර්තන සම්ප්‍රදායන්ට අයත් නාට්‍යමය පෙළපාලි වන්නේ,

i. ගුරුගේ මාලාව හා අසුර යක්කම
ii. අඹ විද්මන හා අසුර යක්කම
iii. වැදි යක්කම හා ගුරුගේ මාලාව
iv. අසුර යක්කම හා ගුරුගේ මාලාව

23. නර්තන ශිල්පිනියන් අතරින් හිස වෙස්තබා ප්‍රසිද්ධියට පත් කාන්තාවක් වන්නේ,

i. චිත්‍රා අල්ගම මහත්මියයි
ii. සීතා ගමගේ මහත්මියයි
iii. චන්ද්‍රලේඛා පෙරේරා මහත්මියයි
iv. වජිරා චිත්‍රසේන මහත්මියයි

24. **2 + 2 + 3** තිත් රූපය නම් කරනු ලබන්නේ,

i. දෙසුළු මහ
ii. දෙසුලු මැදුම්
iii. දෙමැදුම් මහ
iv. සුළු දෙමැදුම්

**අංක 25 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු පහත වගුව ඇසුරෙන් තෝරන්න.**

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | බිසෝකප් සිටුවීම | හගල යැදීම | මලපේකිරීම | මිල්ල කැපීම |
| 2 | දෙවොල් | අස්නෙ | යක් ඇණුම | යහන් දැක්ම |
| 3 | මිබන්ධනය | අඹ විදමන | පත්තිනි | ආවැන්දුම |
| 4 | දුණුමාලප්පුව | දුණුමාලප්පුව | හත්පද | කප්සිටුවීම |

25. පහන් මඩුව හා දෙවොල් මඩුව ශාන්ති කර්ම දෙකට පමණක් ආවේණික චාරිත්‍ර විධි දෙක වනුයේ,

i. 3 පේළියේ A හා B ය
ii. 1 පේළියේ A හා D ය
iii. 2 පේළියේ C හා D ය
iv. 4 පේළියේ C හා D ය

26. දෙවොල් මඩුවේ හා පහන් මඩුවේ එන නාට්‍යමය පෙළපාලි දෙකක් වන්නේ,

i. 1 පේළියේ B හා D ය
ii. 3 පේළියේ A හා B ය
iii. 3 පේළියේ B හා D ය
iv. 4 පේළියේ B හා D ය

27. කොහොඹාකංකාරියේ සහ දෙවොල් මඩුවේ ඇතුළත් නර්තන අංග දෙක වන්නේ,

i. 2 පේළියේ A හා D ය
ii. 2 පේළියේ B හා D ය
iii. 3 පේළියේ B හා D ය
iv. 4 පේළියේ A හා B ය

28. පොල් පන්දම අතැතිව රංගනයේ යෙදෙන නර්තන අංග දෙක වනුයේ,

i. 4 පේළියේ A හා B ය
ii. 2 පේළියේ B හා C ය
iii. 3 පේළියේ B හා C ය
iv. 2 පේළියේ B හා D ය

29. ශාන්ති කර්ම තුනට පොදු අංගයන් දැකිය හැක්කේ,

i. 1 පේළියේ A හා C ය
ii. 2 පේළියේ C හා D ය
iii. 3 පේළියේ A හා D ය
iv. 4 පේළියේ C හා D ය

30. කොහොඹාකංකාරියේ උපත් කතාව හා සම්බන්ධ නරත්න අංග දෙක වන්නේ,

i. 1 පේළියේ B හා 4 පේළියේ D
ii. 2 පේළියේ B හා 3 පේළියේ D
iii. 4 පේළියේ A හා 3 පේළියේ C
iv. 4 පේළියේ B හා 3 පේළියේ C

31. 'තකට තකට තක තරිකිට කුංදත් තා තක ජිජිකුද' යන කස්තිරම භාවිතා වන ගොඩ සරඹය කුමක්ද?

i. අටවන ගොඩසරඹය
ii. නව වන ගොඩ සරඹය
iii. දහවන ගොඩ සරඹය
iv. එකොළොස්වන ගොඩ සරඹය

32. උඩරට නර්තන සම්ප්‍රදායට ඉමහත් සේවයක් කළ ප්‍රවීන නර්තන ශිල්පියෙකි.

i. එස්.පණීභාරත මහතා

ii. කේ.එස්.ප්‍රනාන්දු මහතා

iii. සව්රිස් සිල්වා මහතා

iv. රද්දැල්ලේ පොඩි මහත්තයා මහතා

33. 'දොංජිංත ගත දොංත' බෙර පදය අයත් තාල රූපය වන්නේ,

i. මාත්‍රා 2 + 2 සුළු තනි තිත වේ

ii. මාත්‍රා 3 + 4 මැදුම් මහ දෙතිත වේ

iii. මාත්‍රා 2 + 4 සුළු මහ දෙතිත වේ

iv. මාත්‍රා 2 + 3 සුළු මැදුම් දෙතති වේ

34. ගැටබෙරයේ සුරල් වාදනය පුහුණු වීම සඳහා වඩාත් යෝග්‍ය සරඹය තෝරන්න.

i. තකට කුදට

ii. තරි තෙරුදඩ

iii. තක් තත්කඩ

iv. තකට කුජිං කඩ

35. කරදිය මුද්‍රා නාට්‍යයට අයත් චරිත දෙකකි.

i. මන්නඩි රාළ, චන්ද

ii. නල, චන්ද

iii. සිසී, දමයන්ති

iv. නල, දමයන්ති

36. 'බර අත්ගෙන කගින් - ඇනකොත් තව් වලින් ' මෙම කවිය අයත් වනුයේ,

i. සිංහරාජ වන්නමට ය

ii. තුරඟා වන්නමට ය

iii. වෛරොඩි වන්නමට ය

iv. සැව්ලා වන්නමට ය

37. 'ගානතෙල් සඳුන් වරලස ඔමරි කොට' මෙම කවිය ගායනා කළ හැකි තාල රූපය වන්නේ

i. සුළු මැදුම් දෙතිතට ය

ii. මැදුම් තනි තිතටය

iii. මහ තනි තිතටය

iv. මැදුම් මහ දෙතිතටය

38. මෙම අඩව්ව සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස් ඇතුළත් වරණය තෝරන්න.

'තක්......තකරොං....... තක්කඩ කුද තකරොං'

i. තකට - තක්කඩ

ii. තක්කඩ - තක්කඩ

iii. ජිත් - තකට

iv. තක්කඩ - තකට

39. උඩරට වෙස් ඇඳුම් කට්ටලයට අයත් රංගවස්ත්‍රාභරණ වනුයේ,

i. හඟල, අවුල්හැරය, ශිඛාන්ධනය

ii. හඟල, අවුල්හැරය, රහුකුට්ටම්

iii. හේලය, හැට්ටය, කෙමෙත්ත

iv. හේලය, හැට්ටය, හස්කඩය

40. 'දොංතකු දොංතකු දොංජින් ගත්තත් ජිං තරිකිට' යන බෙර පදය අයත් තිත් රූපය වන්නේ,

i. සුළු මැදුම් දෙතිත ය

ii. දෙසුළු මැදුම් තුන්තිත ය

iii. සුළු මහ දෙතිත ය

iv. දෙසුළු මහ තුන් තිතය

# නර්තනය (දේශීය)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**01) සියලුම ප්‍රශ්න වලට හිස්තැන් පුරවන්න.**

i. ලී කැටයමින් කළ නරත්න රූපයක් දැකිය හැක්කේ ........................................... දේවාලයේ ය.

ii. කූඹි කතාව ..................................... විසින් රංග රචනය කරන ලද්දකි.

iii. යහන් දැක්ම පහතරට මෙන්ම ....................................... නර්තන සම්ප්‍රදායේ ද එන ශාස්ත්‍රීය නර්තන අංගයකි.

iv. 'මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත් ඔවුන් උඩුකය නග්න වූ අතර යටිකයේ වැඩදැමූ වස්ත්‍ර ඇත්තේය.' යනුවෙන් සටහන් කර ඇත්තේ මහනුවර යුගයේ ලංකාවට පැමිණි .............................. නැමැති ලන්දේසි ජාතිකයා විසිනි.

v. 2 + 2 + 3 තාල රූපය හඳුන්වන්නේ ................................. තිතේ ප්‍රභේධයක් ලෙසිනි.

vi. විජය කුවේණි පුවතට අනුව ........................................ පුරයේ තූර්ය වාදන සහිතව ගීත රාවයක් ඇසුණු බව මහා වංශයේ දැක්වේ.

vii. සරඹ අභ්‍යාස කිරීමේදී ආරම්භක වේගය හඳුන්වනු ලබන්නේ .................................. ලය වශයෙනි.

viii. වෙන්ඩාව හා වෙංගිලම් වාද්‍ය භාණ්ඩ දෙක භාවිත කරනුයේ ......................................... නර්තන සම්ප්‍රදායේය.

ix. සිංහල ජන නැටුමේ එන ලී මල්ලිය දෙමළ ජන නැටුමේදී .................................. ලෙස හඳුන්වයි.

x. සතර අභිනයේ එන

(අ) මුහුණින් භාව ප්‍රකාශනය ............................................. අභිනය

(ආ) රංගවස්ත්‍රාභරණ ..................................... අභිනය

xi. පහත සඳහන් ගීත ඇතුළත් වන්නේ කුමන නාට්‍යයන්හී ද?

(අ) වාසනා දිනේකි මේක ....................................

(ආ) ජීවිතයත් මුහුද වගේ ...................................

02) I තුත්තිගේ ප්‍රභේදයකට අදාලව බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

II මාත්‍රා 2 + 4 තිතට අයත් වන්නමක කවි පදයක් ප්‍රස්තාර කරන්න.

III මාත්‍රා 4 + 4 තිතට අයත් වන්නමක අඩව්වක් ප්‍රස්තාර කරන්න.

**03) පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටි සටහන් ලියන්න.**

i. ආහාර්ය අභිනය

ii. නමස්කාර ගාථා

iii. රණබෙර

iv. ගැමි නැටුම්

v. අංග රචනය

**04) කොහොඹාකංකාරිය, දෙවොල් මඩුව සහ පහන් මඩුව ප්‍රධාන ශාන්ති කර්ම ලෙස හැඳින්වේ.**

i. කොහොඹාකංකාරිය සහ දෙවොල්මඩුව පැවැත්වීමේ අතීත සහ වර්තමාන අරමුණු දෙක බැගින් ලියන්න.

ii. දෙවොල් මඩුවේ සහ පහන්මඩුවේ නර්තන අංග වල සමාන අසමානතා පැහැදිලි කරන්න.

iii. කොහොඹාකංකාරියේ පුරාවෘත්තය සමාජය යහමඟට ගෙනයාමට දායක වන අයුරු සාකච්ඡා කරන්න.

05) i සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් වල සමාන අසමානතා සාකච්ඡා කරන්න.

ii සොකරි නාටකයේ කවියක් මඟින් චරිත නිරූපනය සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

iii අංජලිකා චිත්‍රසේන විසින් රංග රචනය කළ මුද්‍රා නාට්‍ය නම් කර ඒ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

06) i නර්තන කලා ඉතිහාසය පිළිබඳ මහා වංශය ඇසුරෙන් සාධක දෙකක් ඉදිරිපත් කරන්න.

ii අනුරාධපුර පොළොන්නරු යුග ඇසුරෙන් නර්තන කලාවේ දියුණුවට රාජකීය අනුග්‍රහය ලැබුණු අයුරු නිදර්ශන දෙකකින් පැහැදිළි කරන්න.

iii මහනුවර යුගය තුළ නර්තන කලාව පැවති අයුරු දේශඨන වාර්තා දෙකකින් සාකච්ඡා කරන්න.

07)



**A**



**B**



**C**

i. C රූප සටහනෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදායට අයත් සංගීත සම්ප්‍රදාය නම් කර, ඒ පිළිබඳ විස්තරයක් කරන්න.

ii. A රූප සටහන අයත් නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍රාභරණ පිළිබඳ ඇගයීමක් කරන්න.

iii. B රූප සටහනේ නර්තනය සම්ප්‍රදාය බිහිවිම සඳහා බලපාන ලද ආගමික පසුබිම විස්තර කරන්න.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

ශ්‍රේණිය 10

විෂයය :- නාට්‍ය හා රංගකලාව

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................

පිළිතුරු පත්‍රය

I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 11 | 4 | 21 | 4 | 31 | 4 |
| 2 | 2 | 12 | 2 | 22 | 1 | 32 | 2 |
| 3 | 1 | 13 | 1 | 23 | 2 | 33 | 3 |
| 4 | 4 | 14 | 3 | 24 | 4 | 34 | 1 |
| 5 | 2 | 15 | 2 | 25 | 3 | 35 | 3 |
| 6 | 3 | 16 | 1 | 26 | 2 | 36 | 4 |
| 7 | 1 | 17 | 2 | 27 | 4 | 37 | 2 |
| 8 | 4 | 18 | 4 | 28 | 3 | 38 | 3 |
| 9 | 2 | 19 | 3 | 29 | 1 | 39 | 1 |
| 10 | 3 | 20 | 3 | 30 | 2 | 40 | 2 |

(ලකුණු : 1 x 40 = 40)

II කොටස

01.

I. 1998

II. මැණිකේ අත්තනායක, මාදනී මල්වත්ත

III. මද්දලය, සර්පිනාව, වයලීනය, බටනලාව

IV. නළුවා, ආනුෂංගික ශිල්පීන්

V. පුස්කොළ පොත

VI. සොබනා ගගේ ගං ඉවුරේ පතුලක ඉඳ
හඬනා කඳුළු ගඟ පහළින් ගියේ කිමද...... (ල : 2x6 =12)

I. නාට්‍යෝචිත අවස්ථාවක්, සිද්ධියක් හෝ එවැනි අවස්ථා, සිද්ධි කීපයක් හෝ රංගය සඳහා සුදුසු පරිදි ලියා සකස් කරගත් නාට්‍ය පිටපත නාට්‍ය පෙළ ලෙස හඳුන්වයි. (ල : 02)

II. රංග විධාන

චරිත

සංවාද හා ගීත

කුතුහලය දනවන නාට්‍යෝචිත අවස්ථා

ගැටුම් අවස්ථා (ල : 04)

III.

| නාට්‍යමය ලක්ෂණ | චිත්‍රපටි කලාව |
|---|---|
| • සතර අභිනයම භාවිත කිරිම.<br>• සජීවී කලා මාධ්‍යයක් වීම.<br>• එකම ස්ථානයක එකම වේලාවක පමණක් ප්‍රදර්ශනය වීම.<br>• නාට්‍යයට උචිත පරිදි සීමිත පසුතලයක් යොදා ගැනීම. | • රූගත දර්ශන මේ සඳහා යොදා ගැනීම.<br>• පෙර කරන ලද රූප රාමු මගින් ඉදිරිපත් කිරීම.<br>• එක ම අවස්ථාවේ එකම වේලාවක ලොව පුරා දක්නට ලැබීම.<br>• විවිධ ස්ථාන බොහොමයක් විචිත්‍රව භාවිත කිරීම. |

(ල : 04)

02.


I. කොටස් දෙකකි.

1. එළිමහන් රංගභූමි
2. ගෘහස්ථ රංගභූමි (ල : 02)

II.

- රංගභූමිය සමතලා භූමි ප්‍රදේශයක් විය යුතුය.
- ප්‍රේක්ෂකයාට රඟපෑමට ප්‍රමාණවත් තරම් අවකාශයක් තිබිය යුතුය.
- රංගන ශිල්පීන්ට අවම පහසුකම්වලින්වත් සමන්විත විය යුතුය.
- ප්‍රේක්ෂකයාට මදක් උස්ව පිහිටි ස්ථානයක් විය යුතුය. (ල : 04)

III.




සිසුන්ගේ ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න. (ල : 06)

03.

I. රටයකුම හෙවත් රිද්දි යාගය (ල : 02)

II. දොළහ පෙළපාලිය හෙවත් නානුමුරය

කපුයක්කාරිය

දරු නැළවිල්ල

හැන්දෑ පිදේනිය

උඩු වියන් පාලිය (ල : 04)

III. කවි ගායනා සහිත වීම.

සතර අභිනය භාවිතය.

සමාරෝපය

අනුකරණය

අනුරූපණය

සංවාද භාවිතය

ප්‍රේක්ෂක සහභාගිත්වය

රංග භාණ්ඩ භාවිතය හා සැරසිලි භාවිතය

යන නාට්‍යමය ලක්ෂණවලට උදාහරණ සහිතව පැහැදිලි කර තිබිය යුතු ය. (ල : 06)

04.

I. චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සිමාවක් එහි ජිවත්විමේ නළු කාර්යය රූපණය නම් වේ. (ල : 02)

II.

- මෙහෙයවීම.
- අමාරුකම් ගනන් නොගැනීම.
- දැඩි ආත්ම ශක්තියක් වර්ධනය කර ගැනීම.
- ඉවසීම.
- ඕනෑම කායික හා මානසික ස්වභාවයන්ගේ පතුලට ම කිදා බැසීම.
- සාමුහික ව කටයුතු කිරිම.
- ප්‍රෙක්ෂකයාට චරිතය තේරුම් ගැනීමට හැකි ආකාරයෙන් නිරූපණය කිරිම.
- කැපවීම.
- නිසි වේලාවට වැඩ කිරිම. (ල : 04)

III.

- නාට්‍ය පිටපත අධ්‍යයනය කිරීම.
- නාට්‍ය අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කිරීම.
- පිටපතේ ඇති චරිතය හඳුනා ගැනිම.
- චරිතය අධ්‍යනය කිරිම.
- චරිත ලක්ෂණ ඉස්මතුවන පරිදි සංවාද උච්චාරණය කිරිම.
- නාට්‍යයේ ශෛලියට අනුව රූපණ කාර්යය සකසා ගැනිම.
- සෙසු චරිත පිළිබඳ අවබෝධය.
- ක්‍රියාවට අවශ්‍ය පරිදි ප්‍රතික්‍රියා දැක්වීම.

- ආනුෂංගික අංග පිළිබඳ සවිඥානිකව රංගනයේ යෙදිම.
- නාට්‍යයේ යටි පෙළ අරුත් මතුවන සේ දෙබස් උච්චාරණය.

යන ලක්ෂණ විස්තර කර ඇත්නම් (ල : 06)

05.

I. හුණුවටය
හෙන්රි ජයසේන මහතා (ල : 02)

II. පරිවර්තන නාට්‍ය - මනාලයෝ
වැදගත්කම
ඇත්ත කුමක්ද?
අහස්මාලිගා
මකරා
දිරිය මව සහ ඇගේ දරුවෝ

ස්වතන්ත්‍ර නාට්‍ය - පව්කාරයෝ
ජනේලය
කුවේණි
තවත් උදැසනක්
මනරංජන වැඩවර්ජන
අපට පුතේ මගක් නැතේ
සරණ සියොත් සේ පුතුනි හබායන (ල : 04)

III.

- නාට්‍ය රචකයකු හා අධ්‍යක්ෂකවරයෙකු වීම.
- රංගන ශිල්පියෙකු ලෙස රංගනයේ යෙදීම. (හුණුවටය - අසඬක් චරිතය)
- ස්වතන්ත්‍ර නාට්‍ය මෙන්ම පරිවර්තන නාට්‍ය නිෂ්පාදනය කිරිම.
- කුවේණි, ජනේලය වැනි නාට්‍ය වඩාත් උසස් නාට්‍ය නිර්මාණය වීම.
- මෙරට බිහි වූ විශිෂ්ට නාට්‍ය කෘතියක් ලෙස හුණුවටය කතාව නිෂ්පාදනය කිරිම.
- ටෙලි නාට්‍ය රංගනයේ ද දායකත්වය ලබාදීම.
- '' ජනේලය '' ශෛලිගත සම්ප්‍රදායෙන් දෛනික ජීවන ප්‍රශ්න නාට්‍යයට නැංවිම දුෂ්කර යැයි මතයට පිළිතුරක් වශයෙන් ලියා දැක්වීම.

යනාදී කරුණු විස්තර කර ඇත්නම් (ල : 06)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න